# ඉතිහාසය

## 10 ශ්‍රේණිය

## නවවන පාඩම

### 10.9 පුනරුදය



## 10.9 පුනරුදය

මෙම පාඩමෙහි නිපුණතා මට්ටම් සහ ඉගෙනුම්පල පහත පරිදි හදුනාගත හැක.

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම්පල |
|---|---|---|
| 9.0<br>ඓතිහාසික ගෝලීය ප්‍රවනතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා තම උරුමය සහ අනන්‍යතවය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණ දිමෙ ශක්තිය ඇති කර ගනී . | 9.1<br>යුරෝපයේ ඇති වූ පුනරුදයේ ඓතිහාසික පසු බිම විමර්ශනය කරයි. | ➢ පුනරුදය විග්‍රහ කරයි.<br>➢ පුනරුදයට හේතු දක්වයි.<br>➢ යුරෝපය වෙනස්වීමට පුනරුදය බල පෑ ආකරය පෙන්වදෙයි. |
| | 9.2<br>යුරොපයේ පුනරුදය ලංකාව කෙරෙහි බලපෑම විග්‍රහ කරයි. | ➢ පුනරුදය ගෝලීය ප්‍රවණතාවක් ලෙස පෙන්වා දෙයි.<br>➢ පුනරුදය ලංකාව කෙරෙහි බලපෑම විග්‍රහ කරයි.<br>➢ ගෝලීය ප්‍රවණතා වලට මුහුණ දිය යුතු ආකාරය පැහැදිලි කරයි. |

# හැදින්වීම

## පුනරුදය

පුනරුදය යනු ක්‍රි.ව.14 වන සියවසේ සිට 16 වන සියවස දක්වා යුරෝපයේ ශාස්ත්‍රීය,ආගමික හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල සිදු වූ පුළුල් පරිවර්තනයයි.

## යුරෝපා ඉතිහාසය යුග තුනකට බෙදිය හැකිය.

01.පැරණි යුගය - ක්‍රි.පූ.යුගයේ සිට ක්‍රි.ව.5 වන සියවස දක්වා.

(පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරය පැවති යුගය)

02.මධ්‍යතන යුගය - ක්‍රි.ව.5-ක්‍රි.ව.15 වන සියවස දක්වා.

(ක්‍රි.ව.500-ක්‍රි.ව.1500)

03.නූතන යුගය - ක්‍රි.ව.15 වන සියවසේ සිට අද දක්වා .

## පුනරුදය ඇති වීමට බලපෑ හේතු

ඉතාලියේ ප්ලෝරන්ස් නගරයෙන් පුනරුදය ආරම්භ විය.යුරෝපය තුළ පුනරුදය ඇති වීමට බලපෑ හේතු කිහිපයකි.

- ❖ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම.
- ❖ වෙළෙඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහි වීම.
- ❖ බුද්ධි ප්‍රබෝධය
- ❖ පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම.

පිළිතුරු සපයන්න

1. තුර්කිවරුන් කොන්ස්තන්තිනෝපල් නගරය යටත් කරගත් වර්ෂය ලියන්න.

2. ඉතාලියේ ප්ලෝරන්ස් නගරයේ ජීවත් වූ කලාත්මක කටයතු වලට උදවු කළ ධනවත් පවුල නම් කරන්න.

3. පුනරුදය ඇති වීමට බලපෑ හේතු ලියා කෙටියෙන් විස්තර කරන්න.

# <u>යුරෝපයේ වෙනස් වීමට පුනරුදය බලපෑ ආකාරය</u>

යුරෝපය මෙතෙක් පැමිණි ගමන් මග වෙනස් කිරීමට පුනරුදය බලපෑවේ ය.එය අපට ක්ෂේත්‍ර කිහිපයක් යටතේ දැක්විය හැක.

01.ශාස්ත්‍රීය හා කලාත්මක පුනරුදය

- භාෂාව
- සාහිත්‍ය
- චිත්‍ර කලාව
- ප්‍රතිමා කලාව
- ගෘහ නිර්මාණ ශිල්පය

02.විද්‍යාත්මක පුනරුදය

- විශ්වය පිළිබඳ සොයාගැනීම්.
- වෛද්‍ය විද්‍යාව පිළිබඳ නව සොයා ගැනීම.

03.ආර්ථික පුනරුදය

- වෙළෙඳ කටයුතුවල දියුණුව
- නව වෙළෙඳ මාර්ග සොයා ගැනීම.



# <u>භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනය</u>

මධ්‍යතන යුගයේදී ග්‍රීක හා ලතින් භාෂා භාවිතය අවම විය.ග්‍රීක භාෂාව මළ භාෂාවක් බවට පත් විය.පුනරුද සමයේදී ග්‍රීක හා ලතින් භාෂාවෙන් ලියවුන පොත් වැඩි වශයෙන් පරිශීලනයෙන් හා ග්‍රීක ලතින් භාෂා හැදෑරීම නිසා සාහිත්‍ය ක්ෂේත්‍රයේ පුනුරුදයක් ඇති විය.

## <u>පුනරුද සමයේ බිහි වූ ගත් කතුවරු</u>

| රට | ගත් කතුවරු |
|---|---|
| ඉතාලිය | පෙට්රාක්,ඩාන්ටේ,බොකැෂියෝ |
| එංගලන්තය | සර් තෝමස් මුවර්,ප්‍රැන්සිස් බේකන්,විලියම් ෂේක්ස්පියර් |
| ප්‍රංශය | ඉරාස්මස් |

## <u>පිළිතුරු සපයන්න</u>

01.ශාස්ත්‍රීය පුනරුදය යනු කුමක්ද?

02.සාහිත්‍යමය ප්‍රබෝධයක් ඇති වීමට බලපෑ හේතු කෙටියෙන් විස්තර කරන්න.

03.පහත සඳහන් පොත් රචනා කළ ගත් කතුවරු නම් කරන්න.

- ඩිවිනා කොමඩියා
- ලෝරාට සැහැලි කවි

04.මානව වාදය යනු කුමක්ද?

# <u>කලා ශිල්ප</u>

පුනරුදය සමයේ ප්‍රබල පරිවර්තනයක් සිදු වූ ක්ෂේත්‍රයකි කලා ශිල්ප.

## <u>මධ්‍යතන යුගයේ සහ පුනරුද සමයේ කලා ශිල්පවල වෙනස්කම්</u>

| පුනරුද සමයට පෙර අවධියේ කලා ශිල්පවල ස්වභාවය | පුනරුද සමයේ කලා ශිල්ප |
|---|---|
| ආගමික මුහුණුවරක් ගැනීම. | ලෞකිකත්වයට මූලිකත්වය ලබා දීම. |
| ක්‍රිස්තුස් වහන්සේ,කන්‍යා මරියතුමිය හෝ ජනප්‍රිය සාන්තුවරයන් නිර්මාණවලට වස්තු විෂය වීම. | රජවරුන්,බිසෝවරුන්,කුමර කුමරියන්,ධනවත් පවුල්වල අය ද වස්තු විෂය වීම. |
| ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වීම සහ ඔවුන්ගේ නිර්මාණ එන ශ්‍රේණියේ නමින් හැඳින්වීම. | නිර්මාණය කතගේ නමින් ම එළි දැක්වීම. |
| පල්ලිය පමණක් කලා නිර්මාණවලට අනුග්‍රහ දැක්වීම. | විවිධ ධනවතුන් අනුග්‍රහ දැක්වීම. |
| ආගමික භක්තියක් ජනිත කිරීම මූලික අරමුණ වීම. | රස වින්දනය ඇති කිරීම මූලික පරමාර්තය වීම. |
| ස්වාධීන නිර්මාණ කිරීමට ඉඩක් නොවීම. | ස්වාධීන තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාන බිහි කිරීම. |

## <u>පිළිතුරු ලියන්න.</u>

01.පහත වගුව පුරවන්න.

| කලා ක්ෂේත්‍රය | ශිල්පියා | නිර්මාණ |
|---|---|---|
| චිත්‍ර | | |
| ප්‍රතිමා | | |
| ගෘනිර්මාණ ශිල්පය | | |

02.පුනරුද සමයේ චිත්‍ර කලාවේ සිදු වූ වෙනස්කම් ලියන්න.

03.පුනරුද සමයට පෙර සහ පසු ගෘහ නිර්මාණ ශිල්පයෙහි දැකිය හැකි ලක්ෂණ ලියන්න.

## විද්‍යාත්මක දියුණුව

පෙළපොත අධ්‍යනය කර විද්‍යාත්මක ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් පිළිබඳව පහත වගුව පුරවන්න.

| නව සොයා ගැනීම | සොයා ගත් පුද්ගලයා | රට |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

## වෛද්‍ය විද්‍යාවේ දියුණුව

| නව සොයා ගැනීම | සොයා ගත් පුද්ගලයා |
|---|---|
| | |
| | |
| | |

## දේශපාලන නවෝදය

මධ්‍යතන යුගයේදී දේශපාලන බලය විමධ්‍යගතව තිබුණි.ප්‍රාදේශීය පාලකයින් බලවත් වූ අතර ජනතාව තුළද එක් රටක් එක් ජාතියක් යන හැඟීම නොමැති විය.

පුනරුද සමයේ බලය මධ්‍යගත වීමක් සිදුවිය.මෙකල සිදු වූ වැදගත්ම වෙනසකි ජාතික රාජ්‍ය බිහි වීම.එක් රටක් එක් ජාතියක් යන පදනම මත ජාතික රාජ්‍යය බිහි විය.රජතුමා පාලනයේ ප්‍රධානියා වූ අතර ඔහු වටා බලය කේන්ද්‍රගත් විය.මධ්‍යම පන්තියක් බිහි වූ අතර ඔවුන් පාලනයට සම්බන්ධ විය.වැටුප් ලබන සේවකයින් පිරිසක් බිහි විය.ඉඩම් හිමි වංශාධිපති වරුන්ගේ බලය පිරිහිණි.

# ආර්ථික නවෝදය

- ❖ මධ්‍යතන යුගයේ පැවති ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය පරිහානියට පත් විය.
- ❖ වාණිජ ආර්ථික රටාවක් ගොඩ නැගුණි.
- ❖ වෙළෙඳ කටයුතුවලට රජුගේ අනුග්‍රහය ලැබුණි.
- ❖ ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති හා බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය.
- ❖ දේශගවේශනයේ ප්‍රතිපලයක් ලෙස අන්තර්ජාතික වෙළෙඳාම දියුණු විය.
- ❖ මුදල් භාවිතය දියුණු විය.

# නව වෙළෙඳ මාර්ග සොයා ගැනීම.



## දේශගවේෂන කටයුතු වලට බලපෑ හේතු.

- ➢ ක්‍රි.ව. 1453 දී තුර්කීවරුන් කොන්ස්තන්තිනෝපල් නගරය යටත් කර ගැනීම.
- ➢ දේශගවේෂන කටයුතු වල යෙදීමට සුදුසු පරිසරයක් යුරෝපයේ ඇති වීම.
- ➢ නාවික ගමන් වල සුරක්ෂිත ව යෙදීමට හැකි මාලිමා යන්ත්‍ර,උතුරු තරු මාපකය නිපද වීම.
- ➢ පුනරුදයේදී ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.
- ➢ ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝදයක් ලැබීම.
- ➢ ජාතික රාජ්‍යයන් මෙම ගමන් සඳහා අනුග්‍රහ දැක්වීම.

පිළිතුරු ලියන්න

01.දේශ ගවේශන සදහා මුලින්ම සම්බන්ධ වූ රටවල් දෙක නම් කරන්න.

02.නාවික කටයුතු වලට උදව් කල පෘතුගාල රජතුමා කව්ද?

03.පහත වගුව පුරවන්න.

| රට | දේශගවේෂකයා | සොයාගත් රට |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

# පුනරුදයේ ගෝලීය ප්‍රවණතාව

- පුනරුදය ඉතාලියේ ප්ලෝරන්ස් නගරයෙන් ආරම්භ වී සෙසු යුරෝපා රටවල් වලට ව්‍යාප්ත විය.
- දේශගවේෂනයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝප රටවල යටත් විජිත ලොව පුරා බිහිවිය.
- යටත් විජිත බිහිවීම නිසා යුරෝපා රටවල දේශපාලන,වෙළෙද මෙන්ම සමාජ සංස්තික ලක්ෂණ ලොව පුරා ව්‍යාප්ත විය.

| අනු ශීර්ෂ | ශ්‍රී ලංකාව යටත් විජිතයක් වීමට පෙර තත්වය | ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටතේ යටත් විජිතයක් වීමෙන් පසු පුනරුදයේ බලපෑම |
|---|---|---|
| i. දේශපාලන වෙනස්කම්<br>• පාලන ක්‍රමය<br>• නිලධාරීන්<br>• නීතිය | ✓ රාජාණ්ඩු පාලන ක්‍රමයක් පැවතුණි.<br>✓ ප්‍රාදේශීය වශයෙන් පාල නය බෙදී තිබුණ<br>✓ රට හා දිසාවන් වශයෙන් අදිකාරම් ,දිසාවෙ,මොහොට්ටාල වැනි සම්ප්‍රදායික නිලධාරී පිරිසක් විසින් පාලන විය.<br>✓ පැරණි නීති පද්ධතියක් තිබුණි.<br>✓ රජුට එම නීති පද්ධතියේ ඉහළම ස්ථානයක් ලැබුණි. | • ආණ්ඩු ප්‍රතිසංස්කරණ සිදු කෙරිණි.<br>• මුලු දිවයිනම බ්‍රිතාන්‍ය කිරීටයටයටත් කොට එකම පාලනයක් ඇති විය.<br>• අලුත්පාලන ක්‍රම වලට ගැලපෙන නව නිලධාරී පන්තියක් බිහිවීම.<br>• යුරෝපීය නීති මූලධර්ම අනුකූල නීති පද්ධතියක් ඇති කලහ.( රෝම ලන්දේසි නීතිය )<br>• යුක්තිය පිසිදලීමේ අධිකරණයක් විය. |
| ii. ආර්ථික වෙනස්කම්<br>• මුදල්<br>• වෙළෙදාම<br>• මාර්ග | ✓ ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් තිබුණි.<br>✓ මුදල් භාවිතය මද වශයෙන් පැවතුණි.<br>✓ ජාත්‍යන්තර වෙළෙදාම සිදුවූයේ මද වශයෙනි.<br>✓ මාර්ග තිබුණේ මිනිසුන්ට පයින් එහා මෙහා යාමටය.<br>✓ මාර්ග තිබුණේ ඉතා අඩුවෙනි. | • ආනයන අපනයන ආර්ථිකයක් බිහිවිය.වතු වගාව ආරම්භ විය.<br>• මුදල් භාවිතය ප්‍රචලිත විය.<br>• බැංකු,රක්ෂණ වැනි ආයතන බිහිවිය.<br>• අන්තර්ජාතික වෙළෙද කටයුතුවලට සම්බන්ධ විය.<br>• මහා මාර්ග,දුම්රිය මාර්ග දිවයින පුරා විහිදුණි.<br>• මුදල් උපයා ගත් මධ්‍යම පන්තියක් බිහිවිය. |
| ii. සමාජ සංස්තික වෙනස්කම්<br>• තොරතුරු දැන ගැනීම<br>• ආගම | ✓ තොරතුරු දැනගත්තේ පුද්ගල සන්නිවේදනයෙනි.<br>✓ රටේ ඈත පැවති තොරතුරු ඉක්මනින්<br>✓ ස්න්නිවේදනය නොවීය.<br>✓ බුද්ධර්මයේ බලපෑමෙන් ආගමික හා සංස්තික කටයුතුවල ප්‍රබෝධයක් ඇති විය. | • මුද්‍රණ යන්ත්‍රය ලංකාවට හඳුන්වා දීමෙන් පොත්පත්, සගරා, පුවත්පත්,ප්‍රකාශයට පත් වී තොරතුරු හා දැනුම ව්‍යාප්ත විය.<br>• රෝමානු කතෝලික, රෙපරමාදු යන ආගම්වල බපෑමෙන් පල්ලි,දේවස්තාන ඉදිවිය. |

පිළිතුරු සපයන්න

01.ලෝක සිතියමක පහත සඳහන් රටවල් හා නගර ලකුණු කර නම්කරන්න .

- එංගලන්තය
- ජර්මනිය
- ප්‍රංශය
- ඉතාලිය
- ප්ලොරන්ස්
- වැනීසිය
- රෝමය
- ග්‍රීසිය
- කොන්ස්තන්තිනෝපලය
- පෘතුගාලය

02.යුරෝපයයෙන් ආරම්භවූ පුනරුදය ලෝකයේ සෙසු රටවල් වලට ව්‍යාප්ත වූ ආකාරය විස්තර කරන්න.

03.ලෝකය වටා පළමු වරට ගමන් කළ නාවිකයා කව්ද?

04.පුනරුදය නිසා විද්‍යාත්මක ඇති වූ දියුණුව ක්ෂේත්‍ර දෙකක් පදනම් කරගෙන විස්තර කරන්න.

V.K.A.A.K. කුරුප්පු

කෑ/ දෙහි / මියනවිට ක.වි , දැරණියගල